# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1416/ 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023 திகதி

දිනය / Date: 12/11/2023 පැය 1500

## මාධ්‍ය නිවේදනය

### 01. මාරක රිය අනතුරක් - පදියතලාව පොලිස් වසම.

2023.11.12 වන අද දින උදෑසන කාලයේ පදියතලාව පොලිස් වසමේ පදියතලාව මහියංගනය ප්‍රධාන මාර්ගයේ කිරවාන ප්‍රදේශයේදී මහියංගනය දෙස සිට පදියතලාව දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකිව දකුණු පසට ධාවනය වී මාර්ගයෙන් ඉවතට පැන ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියදුරු බරපතල තුවාල ලබා පදියතලාව රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වූ තිස්සපුර, උහන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පදියතලාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පදියතලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - මින්නේරිය පොලිස් වසම.

2023.11.12 වන අද දින අළුයම් කාලයේ මින්නේරිය පොලිස් වසමේ ජයන්තිපුර ප්‍රදේශයේදී ගිරිතලේ දෙස සිට ජයන්තිපුර දෙසට ධාවනය වූ කැබ් රථයක් රියදුරුට වේගය පාලනය කර ගැනීමට නොහැකිව එම දෙසටම ගමන් ගත් පාපැදියක ගැටී කැබ් රථය ඉදිරියට ඇදී ගොස් මාර්ගයේ පෙරලී අනතුරක් සිදුව ඇත. අනතුරින් පාපැදිකරු තුවාල ලබා පොලොන්නරුව රෝහලට ඇතුළත් කිරීමේදී මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 48 ක් වූ විජයරාජගම, ගිරිතලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පොලොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කැබ් රථ රියදුරු අනතුරින් පසු පලා ගොස් ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා මින්නේරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**